# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1956/17 - 2016 මාර්තු මස 01 වැනි අඟහරුවාදා - 2016.03.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### රේගු නිවේදනයයි

රේගු ආඥාපනත (235 වන අධිකාරය)

**2003 අංක 2 දරන රේගු (සංශෝධිත) පනතේ ''ඉ'' උපලේඛනයේ 10 වන වගන්තිය යටතේ නියෝගය**

2003 අංක 2 දරන රේගු (සංශෝධිත) පනතේ ''ඉ'' උපලේඛනයේ අංක 10 වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව රවි කරුණානායක වන මම, මුදල් අමාත්‍යවරයා වශයෙන් අංක 87.02, 87.03, 87.04, 87.05 සහ 87.11 යන සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ යටතේ වර්ගීකරණය වන ආනයනය කරනු ලබන මෝටර් වාහන සඳහා තීරු බදු සහ අනෙකුත් සියලු බදු හා ගාස්තු අයකිරීම සඳහා වටිනාකම (මිළ) නියම කිරීම පහත සඳහන් ලෙස සිදු කළ යුතු බවට මෙයින් නියම කරනු ලැබේ. මෙම නියෝගය වර්ෂ 2016 මාර්තු මස 01 වැනි දින සිට නැවත දන්වන තෙක් බලපැවැත්වේ.

*මෝටර් වාහන සඳහා රේගු වටිනාකම (මිළ) ගණනය කිරීම*

සංයෝජිත වර්ගීකරන ශීර්ෂ අංක 87.02, 87.03, 87.04, 87.05 සහ 87.11 යටතට වැටෙන මෝටර් වාහන සඳහා රේගු වටිනාකම (මිළ) පහත සඳහන් අයිතමයන් i, ii, iii සහ iv හි එකතුව වන පරිදි ගණනය කළ යුතු ය.

(1) පහත (අ) හා (ආ) හි සඳහන් විකල්ප අගයන්ගෙන් වැඩි අගය ;

(අ) නිෂ්පාදකයා විසින් ප්‍රකාශිත මිල පදනම් කරගෙන, රේගු අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ලබන වටිනාකම

(ආ) ඉන්වොයිස් කරන ලද නැව තෙක් නොමිලේ (FOB) වාහනයේ වටිනාකම.

(ii) ශ්‍රී ලංකාවේ වරාය දක්වා ප්‍රවාහන ගාස්තු,

(iii) ශ්‍රී ලංකාවේ වරාය දක්වා ප්‍රවාහන කිරීමට අදාළ පැටවීම, බෑම සහ අදාළ මෙහෙයුම් ගාස්තු,

(iv) ශ්‍රී ලංකාවේ වරාය දක්වා රක්ෂණ වාරිකය,

2003 අංක 2 දරන රේගු (සංශෝධිත) පනතේ ''ඉ'' උපලේඛනයේ 10 වගන්තිය යටතේ වර්ෂ 2015 සැප්තැම්බර් මස 22 වැනි දින පළ කරන ලද අංක 1933/16 දරන ගැසට් නිවේදනය සහ 2015 ඔක්තෝබර් මස 19 වැනි දින පළ කරන ලද අංක 1937/3 දරන ගැසට් නිවේදනය 2016.03.01 දින සිට මෙයින් අවලංගු කරමි. කෙසේ වුවද, 2015 ඔක්තෝබර් මස 18 දින හෝ ඊට පෙර ප්‍රතිෂ්ඨාපනය කරන ලද සහ පසුව සංශෝධනය නොකරන ලද ණයවර ලිපිය (ලිපි) පදනම් කරගෙන ආනයනය කරන ලද මෝටර් වාහන වල රේගු වටිනාකම තීරණය කිරීම සඳහා අංක 1901/3 දරන 2015 පෙබරවාරි මස 10 වැනි දිනැති ගැසට් නිවේදනය අවලංගු සේ නොසලකා කටයුතු කළ යුතු වේ.

රවි කරුණානායක,
මුදල් අමාත්‍ය.

2016 මාර්තු මස 01 වැනි දින,
මුදල් අමාත්‍යාංශය,
කොළඹ 01.

03 - 553